| | | |
|---|---|---|
| සිත් | අකුසල | රෝගී වජ්ජ දුක්ඛ අර්ථයෙන් අකුසල නම්වේ. |
| | කුසල | ආරෝග්‍ය අනවජ්ජ සුඛ අර්ථයෙන් |
| | විපාක | කුසල සහ අකුසල කර්මයනට ප්‍රතිඵල ගෙනෙන සිත් |
| | ක්‍රියා | කර්ම හො විපාක නොවන ක්‍රියාමාත්‍රයක් පමණක් වූ සිත්ය. |
| | අබ්‍යාකත | කුසල හෝ අකුසල නොවූ සියල්ල (විපාක/ක්‍රියා/රූප/නිබ්බාන) |

## දිට්ඨි -

අකුසල සිතේ යෙදෙන දිට්ඨිය මිච්ඡා දිට්ඨියයි. කුසල සිතේ නම් සම්මා දිට්ඨියයි. මිථ්‍යා දිට්ඨියද නැවත පහත ලෙස කොටස් කල හැකියි.

- සක්කාය දිට්ඨි * ආත්ම දිට්ඨි * සස්සත දිට්ඨි * උච්ඡේද දිට්ඨි

| | | |
|---|---|---|
| දිට්ඨි | සම්මා දිට්ඨි | ප්‍රඥාව |
| | මිථ්‍යා දිට්ඨි | සක්කාය දිට්ඨි - පඤ්ච උපාදානස්ඛන්ධය මම මගේ මගේ ආත්මය ලෙස වැරදි අවබෝධය. |
| | | ආත්ම දිට්ඨි - |
| | | සස්සත දිට්ඨි - ආත්මය මරණින් පසු ඇතැයි විශ්වාසය. |
| | | උච්ඡේද දිට්ඨි - මරණින්පසු කිසිවක් නැතැයි විශ්වාසය. |
| | නියත මිථ්‍යා දිට්ඨි | දස අකුසලයන්හි අගට දැක්වෙන්නේ මෙයයි. |

අකුසල සිත් ගැන කථාකරන විට සොමනසස් සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත යෙහි “දිට්ඨි” යනු (ඊලග පිටුවෙන්)